# නීන්නි බබාගේ කතන්දර



මලිත්මී දින්හාරා යහතුගොඩ

# පිදුම

**මාගේ පන්තිය 2A ශ්‍රේණිය භාර**

**ගුරුතුමිය වන මංජුලා සුමනසිංහ ගුරු**

**මෑණියන්ටත්, ආදරණීය අම්මා, තාත්තා,**

**අක්කලා, අයියලා, නංගිලා, මල්ලිලා,**

**ආච්චිලා , සීයලා සහ මාගේ මිතුරු**

**මිතුරියන්ට “ නින්නි බබාගේ කතන්දර”**

**පොත් පිංචය ඉතා ගෞරවයෙන් යුතුව**

**පුදකර සිටිමි.**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක "වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතවුන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමකුළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

# පටුන


| අනු අංකය | විස්තරය | පිටු අංක |
| --- | --- | --- |
| 1 | එකම ගෙදර යාළුවෝ | 1 – 3 |
| 2 | පුදුම කලබලයක් | 4 – 6 |
| 3 | තාරා අම්මා සහ තාරා පැටවු | 7 - 10 |

# එකම ගෙදර යාළුවෝ

අපේ ගෙදර පිටුපස මඩුවේ අපේ කිටී පැටවු දාලා හිටියා. චූටි පැටවු තුන් දෙනයි.



මිකීත් ඒ මඩුවේම ලස්සන පැටවුන් දෙන්නෙක් දාලා. දැන් බෝල වගේ පැටවු පස්දෙනයි.



පස්දෙනාම ටිකෙන් ටික ලොකු වුණා. දැන් එයාලා සෙල්ලම් කරනවා. මම බෝලයක් දැම්මා පැටවු පස්දෙනාම සතුටින් සෙල්ලම් කළා.



# පුදුම කලබලයක්

දවසක් ලේනෙක් ගහක් උඩ අඹයක් කමින් සිටියා. ඒක දැකපු පූසා ගහ ළඟට ගිහින් ලේනාව අල්ලන්න කුරුමානම් ඇල්ලුවා.



පූසා ගහ දිගේ නැග්ගා. ලේනා අඹය බිමට දාලා වෙන අත්තකට පැන්නා. පූසාගේ ඔළුව උඩට අඹය වැටුණා.



පූසා බය වෙලා " පූස් " කියලා පිඹගෙන ගේ පැත්තට පැන්නා. එතන හිටිය මගේ ටොමියා පූසාට බය වෙලා අපේ ළඟට " බුහ් " ගාලා පැනගෙන ආවා. මට හරි හිනා.



# තාරා අම්මා සහ තාරා පැටවු

ඔන්න දවසක් ගඟක් අද්දර ගහක් මුල තාරා අම්මෙක් බිත්තර හතරක් දැම්මා. කාලයක් ගතවුණා.



බිත්තර පිපිරුණා. තාරා පැටවු හතර දෙනෙක් එළියට ආවා.



ඉතින් ටික කාලයක් ගතවුණා. තාරා පැටවු ලොකු වුණා. තාරා අම්මා පැටවුන්ට මාළු අල්ලන්න කියලා දුන්නා.



තාරා අම්මා මහළුවුණා. කාලෙකට පස්සේ ඇය ලෙඩ වුණා. පසුව ඇය මියගියා.



# පසවුදන




නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01

ISBN 978-624-206-840-4